# SLLA පුවත් හසුන


1961 - 2021
60 Years of Excellence in LIS Education in Sri Lanka

වෙළුම 38 කලාපය 01 ජූලි - සැප්තැම්බර් 2021 ISSN 1391 -2531


## පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ ජාතික සම්මන්ත්‍රණය 2021 (NACLIS 2021)



ආචාර්ය රුවන් ගමගේ - සභාපති
SLLA


මහාචාර්ය නිලන්ති ද සිල්වා
උපකුලපති
කැලණිය විශ්වවිද්‍යාලය



ආචාර්ය තරංග රණසිංහ
කැඳවුම්කරු
NACLIS 2021


ආචාර්ය නාමලී සුරවීර සහ
සන්තරුබන් මහතා
මුලසුන - තාක්ෂණික සැසිය
NACLIS 2021

ශ්‍රී ලංකා පුස්තකාල සංගමය විසින් සංවිධානය කරන ලද පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ ජාතික සම්මන්ත්‍රණය (NACLIS) 2021 "පුස්තකාල පරිවර්තනය තුළින් තිරසාරභාවය කරා ගමන් කිරීම" යන තේමාව යටතේ 2021 සැප්තැම්බර් මස 11 වන දින ZOOM තාක්ෂණය ඔස්සේ පවත්වන ලදී.

කැලණිය විශ්වවිද්‍යාලයේ උපකුලපතිනි මහාචාර්ය නිලන්ති ද සිල්වා මහත්මිය සමාරම්භක උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ අතර තිරසාර සංවර්ධනය සඳහා පුස්තකාල වල වැදගත්කම ඉස්මතු කර දැක්වීය. "ඩිජිටල් සංස්කෘතික උරුම ව්‍යාපෘතිවල තිරසාරභාවය" යන මැයෙන් ඇමරිකා එක්සත් ජනපදයේ ඩෙන්වර් විශ්ව විද්‍යාලයේ ආචාර්ය ක්‍රිස්ටිනා කේ. මටුසිඅක් මහත්මිය විසින් ප්‍රධාන දේශනය පවත්වන ලදී.

පුස්තකාල හා තොරතුරු විද්‍යාවට අදාළව සිංහල, දමිළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම ඉදිරිපත් කළ පර්යේෂණ පත්‍රිකා 12ක් , තාක්ෂණික සැසි 2ක් යටතේ පවත්වන ලද අතර පර්යේෂණ පත්‍රිකාවන්හි සාරාංශය සහ ඒවායේ ඉංග්‍රීසි පරිවර්තන අන්තර්ගත සම්න්ත්‍රණ පත්‍රිකා එකතුව, ඉලෙක්ට්‍රොනික ප්‍රකාශනයක් වශයෙන් මෙම සම්මන්ත්‍රණයේ දී එළි දක්වන ලදී. දෙසියයක ආසන්න ලියාපදිංචි පිරිසකගේ සහභාගිත්වයෙන් පැවති ජාතික සම්මන්ත්‍රණය ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ නිල යූටියුබ් වැනලය ඔස්සේ සජීවීව විකාශය කෙරිණි.


ආරාධිතයින් - පොල්තෙල් පහන දැල්වීම



ආචාර්ය ක්‍රිස්ටිනා කේ. මටුසිඅක්
ඩෙන්වර් විශ්ව විද්‍යාලය
ඇමරිකා එක්සත් ජනපදය


පද්මා බණ්ඩාරනායක මිය සහ
ආචාර්ය ප්‍රදීපන්
තාක්ෂණික සැසිය - මුලසුන
NACLIS 2021


සහභාගිවූවන් -NACLIS 2021

## ඇතුල් පිටු



පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ ජාතික සම්මන්ත්‍රණය 2021 (NACLIS 2021) 01
මාධ්‍ය පුස්තකාල සහ ඒවායේ කාර්යයන් පිළිබඳ මාර්ගගත සම්මන්ත්‍රණය 02
පුස්තකාල සඳහා ISO ප්‍රමිති හඳුන්වාදීම සහ 5S ක්‍රමවේදය පිළිබඳව මාර්ගගත සම්මන්ත්‍රණය 02
අර්බුදයේ වෙනස සඳහා අවස්ථාවක් ලෙස - අතථ්‍ය වැඩමුළුව 02
නව මාවතකට පිවිසෙන්නට බල කෙරුණු නමුත්, ඵලදායක වසරක් 03 -04
විශේෂාංග ලිපිය : තිරසාර සංවර්ධන ඉලක්ක සහ මහජන පුස්තකාල 05-06
ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ විශේෂ මහා සභා රැස්වීම 06
SLLA ප්‍රකාශන කමිටුව (Publication Committee) 2020/2021 06



*Sri Lanka Library Association, Organization of Professional Associations, 275/75, Stanly Wijesundara Mawatha, Colombo 07, Sri Lanka, Tel/Fax: +94-11-2589103, Email:info@slla.lk.*


## මාධ්‍ය පුස්තකාල සහ ඒවායේ කාර්යයන් පිළිබඳ මාර්ගගත සම්මන්ත්‍රණය


ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ විශේෂ පුස්තකාල කණ්ඩායම විසින් 2021 අගෝස්තු 7 වන දින MS Teams තාක්ෂණය හරහා "මාධ්‍ය පුස්තකාල සහ ඒවායේ කාර්යයන්" පිළිබඳ මාර්ගගත සම්මන්ත්‍රණයක් පවත්වන ලදී. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ/ප්‍රධාන පුස්තකාලයාධිපති රංජනී අලුත්ගේ හේරත් මහත්මිය සම්පත්දායක ලෙස සහභාගි වූ අතර ආචාර්ය එස්.කේ. ඉලංගරත්න මහතා සැසිය මෙහෙයවීය. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයින්, වෘත්තිකයන් සහ සිසුන් ඇතුළු 70 දෙනෙකු මෙම සම්මන්ත්‍රණය සඳහා සහභාගී වූ අතර මෙය යූටියුබ් නාලිකාව හරහා සජීවීව විකාශය විය.




## පුස්තකාල සඳහා ISO ප්‍රමිති හඳුන්වාදීම සහ 5S ක්‍රමවේදය පිළිබඳව මාර්ගගත සම්මන්ත්‍රණය

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ විශේෂ පුස්තකාල කණ්ඩායම විසින් සංවිධානය කරන ලද "පුස්තකාල සඳහා ISO ප්‍රමිති හඳුන්වාදීම සහ 5S ක්‍රමවේදය පිළිබඳ මාර්ගගත සම්මන්ත්‍රණයක්" 2021 අගෝස්තු 21 දින "ZOOM තාක්ෂණය ඔස්සේ පවත්වන ලදී. උක්ත සම්මන්ත්‍රණයේ සම්පත්දායකත්වය ශ්‍රී ලංකා වරලත් පිරිස් කළමනාකරණ ආයතනය (CPIM) හි තත්ත්ව සහතික හා අනුකූලතා කළමනාකාරිණී රුවනි සෙනෙවිරත්න මහත්මිය විසින් ලබා දුන් අතර සම්මන්ත්‍රණය මෙහෙයවීම ආචාර්ය එස්. කේ. ඉලංගරත්න මහතා විසින් සිදු කරන ලදී. මෙම වැඩමුළුවට ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පාලක සභා සාමාජිකයින්, පුස්තකාල වෘත්තිකයින් සහ සිසුන් ඇතුළු 70 ක් සහභාගී වූහ. මෙම වෙබ් සම්මන්ත්‍රණය SLLA YouTube නාලිකාව හරහා සජීවීව විකාශය වූ අතර පටිගත කරන ලද වීඩියෝ පටය https://www.youtube.com/watch?v=_j-ChGpqErI&t=462s දරණ සබැඳිය ඔස්සේ නැරඹිය හැකිය.






## අර්බුදයේ වෙනස සඳහා අවස්ථාවක් ලෙස - අත්‍යා වැඩමුළුව



අර්බුදකාරී වාතාවරණය තුළ ඇති ප්‍රධාන අභියෝග සහ අවස්ථා පිළිබඳව කෙටි අවබෝධයක් ලබා දීම අරමුණු කරගනිමින් ශ්‍රී ලංකා පුස්තකාල සංගමය විසින් නොමිලේ මෙම අත්‍යා වැඩමුළුව සංවිධානය කරන ලදී. මෙම අවස්ථාව මඟින් සහභාගීවන්නන්ට තම අත්දැකීම් ඉදිරිපත් කිරීමට, සාකච්ඡා කිරීමට සහ අදහස් හා ක්‍රියාවන් හුවමාරු කර ගැනීමට සහ තමන්ම අභිප්‍රේරණය කිරීමට අවස්ථාවක් ලැබුණි. මෙම වැඩමුළුව DIPLIS සිසුන් සඳහා 2021 ජූලි 24 දින zoom තාක්ෂණය මඟින් පැවැත්විණි. SLLA අධ්‍යාපන වැඩසටහන සඳහා සිසුන් සියයක් පමණ සහභාගී වූහ. ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන උපදේශකසහ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිනි ආචාර්ය කේ.ආර්. එන්. හර්ෂණී මහත්මිය සම්පත්දායකය ලෙස සහභාගි විය.

මෙම වැඩමුළුව තුළදී, කාලයෙන් ප්‍රයෝජන ගත යුතු ආකාරය පිළිබඳව ආචාර්ය හර්ෂණී සිසුන්ට උපදෙස් ලබා දුන් අතර ඔවුන්ගේ වෘත්තීය අරමුණු නිර්වචනය කිරීමට ඇය විවිධ ක්‍රියාකාරකම් බෙදා ගත්තාය.



ආචාර්ය රුවන් ගමගේ - සභාපති
ශ්‍රී ලංකා පුස්තකාල සංගමය 2020/2021

2020 ඔක්තෝබර් 04 වෙනිදා අප අනුරාධපුරයේ සිට කොළඹ බලා යමින් සිටියේ, එහිදී පැවැත්වුණු සමාරම්භක පාලක සභා රැස්වීම නිම කිරීමෙන් අනතුරුව යි. කොවිඩ් - 19 වසංගතයේ දෙවන රැල්ලේ ආරම්භය පිළිබඳ පුවත අපට අතරමග දී ආරංචි විය. අපේ මාර්ගය හරහා පිහිටි නගර කිහිපයක් අගුලු දමා තිබූ බැවින් ඒවා මඟ හැර නිවෙස් කරා සපැමිණියේ අපහසුවෙනි.

එතැන්පටන් අවුරුද්ද පුරාම දිවයින සිය උපරිම ධාරිතාවයෙන් වැඩකළේ නැත.එනිසා අපට සඳහා නව ක්‍රම සෙවීමට සිදු වූ අතර මාර්ගගත වැඩ, සන්නිවේදනය සහ බෙදා හැරීමේ ක්‍රම වෙතයාමට බලකෙරිණි. රට වසාදැමූ සමයේ පුස්තකාල සංගමයේ (SLLA) කාර්ය මණ්ඩලය නිවසේ සිට වැඩ කරමින් සිටියහ. විවෘත කළ විට, ඔවුන්ට බොහෝ දුරට කටයුතු කිරීමට සිදු වූයේ වැඩ වාර (roster) පදනම මත යි. සියලුම පාලක සභා, විධායක සභා සහ අනෙකුත් කාරක සභා රැස්වීම් මාර්ගගතව පැවැත්විණි.

ප්‍රතිසැලසුම් කළ යුතු පළමු ක්‍රියාකාරකම වූයේ අධ්‍යාපන වැඩසටහනයි. වැඩි කල් නොගොස් අපි සිසුන්ගේ සම්බන්ධතා විස්තර එකතු කළෙමු. සන්නිවේදනය පවත්වා ගැනීම සඳහා සෑම පන්තියක් සඳහාම WhatsApp කණ්ඩායම් නිර්මාණය කළෙමු. භෞතික සම්බන්ධතා පැවැත්විය නොහැකි බැවින්, සිසුන්ට අධ්‍යයන කටයුතු සඳහා අධ්‍යාපන කාර්ය මණ්ඩලය හා සම්බන්ධ වීමට නව සෘජු ජංගම දුරකථන අංකයක් හඳුන්වා දෙන ලදී.

පාඩම් පැවැත්වුණේ Zoom යෙදුම භාවිතයෙනි. ඉගැන්වීම සඳහා Zoom භාවිතා කිරීම පිළිබඳ කථිකාචාර්යවරුන්ට උපදෙස් දෙන ලදී. 2020/2021 වර්ෂය තුළදී, දුරස්ථ පාඨමාලාව ද ඇතුළුව ඩිප්ලෝමා/උසස් ඩිප්ලෝමා වැඩසටහන (DLIS/HDIPLIS) සහ පුස්තකාල ස්වයංක්‍රියකරණය පිළිබඳ පාඨමාලාව (COLA) සඳහා සියලුම පාඩම් මාර්ගගතව පැවැත්වුවෙමු. COLA සඳහා සහභාගී වූ 50 දෙනකු දෙමුහුන් පාඨමාලාවක් ලෙස COLA සම්පූර්ණ කළ අතර DLIS/HDIPLIS පාඨමාලා හදාරන සිසුන් 500 කට අධික සංඛ්‍යාවක් මාර්ගගතව විභාග (මට්ටම් තුනම) සම්පූර්ණ කළහ. ඒවායේ ප්‍රතිඵල ද නිකුත් කෙරෙමින් පවතින අතර නව පාඨමාලා වසර ආරම්භ කිරීමට ද අපි සූදානම් ව සිටිමු.

අතිරේක කියවීමේ ද්‍රව්‍ය ලෙස සිසුන්ට ප්‍රයෝජනවත් විය හැකි සබැඳි ආධාර සඳහා ද්වාරයක් (gateway of resources) අධ්‍යයන පුස්තකාල කණ්ඩායම විසින් ස්ථාපිත කරන ලදී.DLIS සිසුන්ට පුස්තකාල පුහුණුව සඳහා භෞතිකව සහභාගී වීමට නොහැකි විය. ඒ වෙනුවට සිංහල හා දෙමළ මාධ්‍ය DLIS සිසුන් සඳහා වෙන වෙනම දින දෙක බැගින් වූ මාර්ගගත වැඩසටහනක් ලබා දෙන ලදී.

මෙම වසරේ SLLA විසින් ශ්‍රී ලංකාවේ පුස්තකාල විද්‍යා අධ්‍යාපනයේ 60 වන සංවත්සරය සමරනු ලබයි. ත්‍යාග ප්‍රදානෝත්සවය සමඟ පැවැත්වීමට සැලසුම් කරන ලද මෙම උත්සවය වසංගත තත්ත්වය හේතුවෙන් සැමරීමට නොහැකි විය. කෙසේ වෙතත්, මෙවර අප අධ්‍යාපන වැඩසටහන මගින් අත් කරගත් ප්‍රධාන ජයග්‍රහණයක් වූයේ, ශ්‍රී ලංකාවේ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ඉල්ලීම පරිදි පිළියෙල කරන ලද පුස්තකාල හා විඥාපන විද්‍යාව සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සැලසුම් කිරීම සඳහා දැක්වූ සහභාගීත්වයයි. එම ආයතනය මගින් NVQ 5 සහ 6 මට්ටම් සඳහා පුස්තකාල හා විඥාපනවිද්‍යාව ඉගැන්වීම සඳහා විෂය නිර්දේශයක් ද සකස් කරන ලදී. එය ඉදිරියේ දී විද්වත් මණ්ඩලයක සහභාගීත්වයෙන් තවදුරටත් ඇගයීමට ලක් කරනු ඇත.

SLLA කාර්යාල කටයුතු පරිවර්තනය කිරීම මීළඟ අභියෝගය විය. ගිණුම්කරණය දැනට ස්වයංක්‍රියකරණය වෙමින් පවතී. කාර්යාලය මගින් මුදල් භාර ගැනීම මුළුමනින්ම නවතා දැමුණු අතර බැංකු ගිණුමට පමණක් මුදල් බැර කරන ලෙස ක්‍රියාත්මක කරන ලෙස සාමාජිකයින්ට සහ සිසුන්ට උපදෙස් දෙන ලදී. පොත් තැබීම සහ ගිණුම්කරණය විධිමත් කිරීම සඳහා පසුගිය වසර තුළ සිදු කරන ලද පද්ධති විගණනයේ තවත් නිර්දේශ කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී.කාර්යාල සහ වෘත්තීය හමුවීම් සඳහා Zoom ගිණුමක් මිලදී ගන්නා ලදී. කාර්යාල කාර්ය මණ්ඩලයට මයික්‍රොසොෆ්ට් බලපත්‍ර පවරන ලද අතර තොරතුරු (info@slla.lk), අධ්‍යාපනය (edu@slla.lk) සහ සාමාජිකත්වය (members@slla.lk) වැනි පොදු කාර්යයන් සඳහා නව විද්‍යුත් තැපැල් නිර්මාණය කරන ලදී. වෙබ් අඩවිය පළමු කාණ්ඩයේ ඩොමේන් නාමයකට පරිවර්තනය විය (slla.lk). සාමාජිකත්වයට මෙන් ම, උනන්දුවක් දක්වන සියලු දෙනාට ම භාවිත කළ හැකි වන පරිදි යූ ටියුබ් නාලිකාවක් (www.youtube.com/sllalk) සහ ෆේස්බුක් පිටුවක් ද (www.facebook.com/slla.lk) නිර්මාණය කරන ලදී.

SLLA ප්‍රකාශන සියල්ලම e-ප්‍රකාශන ලෙස බෙදා හරින ලදී . සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍ය තුනෙන්ම SLLA Newsletter කලාප පහක් නිකුත් කිරීම වත්මන් ප්‍රකාශන කමිටුවේ ජයග්‍රහණයකි. Sri Lanka Library Review ශාස්ත්‍රීය සඟරාවේ කලාප දෙකක් ප්‍රකාශයට පත් කරන ලදී . මෙම සඟරාව Sri Lanka Journals Online (sljol.info) වෙබ් අඩවියට ඇතුළු වීමෙන් තවත් නව සන්ධිස්ථානයක් වාර්තා කෙරිණි. මෙහි අනුමත කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම වෙනුවෙන් පෙර ප්‍රකාශන කමිටුව (2019/2020) ද මෙහි දී අගය කළ යුතුය. ඊට අමතරව, ආචාර්ය ආර්.එච්.අයි.එස් රණසිංහ මහත්මිය විසින් ලියන ලද, '**අවසාන වසරේ උසස් ඩිප්ලෝමා ශිෂ්‍යයින් සඳහා රචනා ලිවීම සඳහා වූ මාර්ගෝපදේශය**' ප්‍රකාශය සිංහල මාධ්‍යයෙන් දෙමළ භාෂාවට පරිවර්තනය කරන ලදී.

සමාලෝචනය කෙරෙමින් පවතින වසරේ තවත් ලක්ෂණයක් නම් කාර්යයන් ප්‍රමිතිකරණය කිරීමට සහ වාර්තා යාවත්කාලීන කිරීමට ගත් උත්සාහය යි. සියළුම සාමාජිකයින්ට යාවත්කාලීන කරන ලද සම්බන්ධතා විස්තර එවන ලෙස කරන ලද

3 පිටුවෙන් ......

ඉල්ලීමකින් අනතුරුව සාමාජික නාමාවලිය සහ තැපැල් ලැයිස්තුව යාවත්කාලීන කරන ලදී. වසර ගණනාවකට පෙර කෙටුම්පත් කර තිබූ කාර්යාල ක්‍රියා පටිපාටි යළිත් මතුපිටට ගෙන ආ අතර එහි අවසන් ප්‍රතිඵලය ලෙස **ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ මෙහෙයුම් අත්පොත** නිකුත් කිරීමට නියමිත ය. උපායමාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ අධීක්ෂණ කාරක සභාව (COMAISP) යටතේ ක්‍රියාත්මක වන සංගමයේ නීති සංශෝධනය කිරීමේ අනුකමිටුව සිය වැඩ කටයුතු ඉදිරියට ගෙන ගිය අතර යෝජිත නීති සම්පාදනය කිරීමේ අවසන් අදියරේ සිටී. COMAISP යටතේ ව්‍යාපෘතියක් ලෙස 'අනාථ නිවාස හා ළමා ආරක්ෂණ මධ්‍යස්ථාන වල පුස්තකාල සඳහා අවම ප්‍රමිති' ද ප්‍රකාශයට පත් කරන ලදී.

මේ වසර තුළ දී ක්‍රියාත්මක වූ සාමාජික ප්‍රේරණයේ (membership drive) ප්‍රතිපලයක් ලෙස හිඟ මුදල් ගෙවීමෙන් පසු සාමාජිකයෝ රැසක් සිය සාමාජිකත්වය අලුත් කර ගත්හ. ආශ්‍රය සාමාජිකත්වය සහ අධි සාමාජිකත්වය සඳහා අයදුම්පත් 51 ක් ලැබීමත්, නව සාමාජිකයින් 44 ක් මේ දක්වා ආකර්ෂණය කර ගෙන තිබීමත් යන දත්ත මගින් සංගමයේ ඉදිරිය පිළිබඳ නව බලාපොරොත්තු දල්වයි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වරලත් පුස්තකාලයාධිපතිවරුන්ගේ සංඛ්‍යාව 326 දක්වා ඉහළ ගිය අතර මුළු ක්‍රියාකාරී සාමාජික සංඛ්‍යාව මේ වන විට 500 ඉක්මවයි.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය (NLSL), ජාතික පුස්තකාල හා තොරතුරු විද්‍යා ආයතනය (NILIS) - කොළඹ විශ්ව විද්‍යාලය, පුස්තකාල හා තොරතුරු විද්‍යා දෙපාර්තමේන්තුව - කැලණිය විශ්ව විද්‍යාලය, විශ්ව විද්‍යාල පුස්තකාලයාධිපතිවරුන් ගේ සංගමය (ULA), ජාත්‍යන්තර පුස්තකාල සංගම් හා ආයතන සම්මේලනය (IFLA), තොරතුරු විද්‍යා හා තාක්ෂණ සංගමය (ASIS&T) යනාදී දේශීය හා ජාත්‍යන්තර සංවිධාන සමඟ අඛණ්ඩව ජාල ගත වීම පුස්තකාල සංගමය විසින් සිදු කරන ලදී.

NLSL විසින් සකස් කරන ලද කොවිඩ් -19 උපදේශන චක්‍රලේඛ පිළිබඳ ජනතාව දැනුවත් කිරීම සඳහා අප සංගමය දායක විය. රජයේ හා පළාත් පුස්තකාලයාධිපතිවරුන් සඳහා යෝජිත සේවා ව්‍යවස්ථාව සකස් කිරීමට ද අප දායක වූ අතර වැටුප් විෂමතා ගැටලු විසඳීම සඳහා ශ්‍රී ලංකා වැටුප් කොමිසම මගින් යෝජනා ඉදිරිපත් කරන ලෙස සිදු කළ ඉල්ලීමට ප්‍රතිචාර ලෙස රජයේ පුස්තකාලයාධිපති කණ්ඩායමේ සහභාගීත්වයෙන් සකස් කෙරුණු යෝජනාවලියක් ඉදිරිපත් කෙරිණි. එසේම, පුස්තකාල සංගමය මගින් පිරිනමන පුස්තකාල විද්‍යා සුදුසුකම්වල මෑත කාලීන වෙනස්කම් පිළිබඳව දැනුම්වත් කරමින් රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ වෙත ලිපියක් යැවීමට කටයුතු කරන ලදී. අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් පුස්තකාල සංවර්ධන ඒකකය විසින් සංවිධානය කරන ලද පාසල් පුස්තකාල මාර්ගෝපදේශන සකස් කිරීම සඳහා පාසල් පුස්තකාල කණ්ඩායමේ කැඳවුම්කරු සහභාගී විය. SLLA හි හිටපු සභාපතිවරයකු වූ මහාචාර්ය පියදාස රණසිංහයන් ගේ 5 වැනි ගුණ සමරුව සිහිපත් කරමින් ඔහු පිළිබඳ මතක සටහනක් ASIS&T දකුණු ආසියා ශාඛාවේ ප්‍රවෘත්ති පත්‍රයට සපයන ලදී. රජයේ පුස්තකාලයාධිපතිවරුන් ගේ කණ්ඩායම විසින් ප්‍රතිරාව නමින් සඟරාවක් ප්‍රකාශයට පත් කිරීමට සැලසුම් කරමින් සිටී.

SLLA 2020/2021 පාලක සභාවේ වෘත්තීය කණ්ඩායම් සහ කමිටු විසින් මාර්ගගත සම්මන්ත්‍රණ (webinar) කිහිපයක් පවත්වන ලදී. ***රජයේ පුස්තකාලයාධිපතිවරුන් බඳවා ගැනීම් සඳහා වූ තරඟ විභාගය සඳහා පුනරීක්ෂණ සම්මන්ත්‍රණ මාලාව, පාසල් පුස්තකාල සේවකයින් සඳහා පාසල් පුස්තකාල මාර්ගෝපදේශන, ගූගල් වැඩ අවකාශය (යෙදුම), බුද්ධිමය දේපල හා ප්‍රකාශන හිමිකම් නීති, අර්බුදයෙන් එපිට අද්විතීය අවස්ථා (අභිප්‍රේරණ වැඩමුළුව) සහ මාධ්‍ය පුස්තකාල සහ ඒවායේ ක්‍රියාකාරීත්වය ඒවාට ඇතුළත් වේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රවේශය අපේක්ෂා කරන උසස් පෙළ සිසුන් සඳහා කොළඹ මහජන පුස්තකාලය සමඟ එක්ව සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදී.*** මීට අමතරව 2021 වර්ෂයේ පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ ජාතික පර්යේෂණ සම්මන්ත්‍රණය (NACLIS) 2021 සැප්තැම්බර් 11 වන දින මාර්ගගතව පවත්වන ලදී. රජයේ පුස්තකාලයාධිපති කණ්ඩායම විසින් සාමාජිකත්වයෙන් ලිපි අන්තර්ගත කර ප්‍රතිරාව සඟරාව ප්‍රකාශයට පත් කරන ඇත.

සමස්තයක් වශයෙන් ගත් කල, ක්‍රියාකාරිත්වයේ සහ සහභාගීත්වයේ නව මංපෙත් සක්‍රීය කරමින් අන්තර්ජාලයේ වැඩ කිරීමට වර්තමාන ගෝලීය වාතාවරණය මගින් අපට බල කරන ලද බව පැහැදිලි ය. 2020/2021 සඳහා ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සභාපති වශයෙන්, පසුගිය වසර පුරා සිදු කරන ලද සියලු කටයුතුවල දී ලබා දුන් සහයෝගය වෙනුවෙන් පාලක සභාව, විධායක කමිටුව, සාමාජිකත්වය, ශිෂ්‍ය ශිෂ්‍යාවන්, කාර්ය මණ්ඩලය, සේවා සැපයුවන්, සහ සුභ පතන්නන් වෙත අප ගේ ආචාරය පුදකරන අතර, ඔවුන් සියලුම දෙනාට ම සුභ පතමි.

ඔබට ස්තුතියි!

ආචාර්ය රුවන් ගමගේ
සභාපති
ශ්‍රී ලංකා පුස්තකාල සංගමය(2020/2021)

**ඔබේ තොරතුරු තවමත් යාවත්කාලීන කර නොමැති නම්, පහත සම්බන්ධක භාවිතා කර හැකි ඉක්මනින් යාවත්කාලීන කරන්න**

**https://forms.gle/4eiRXog8fva2MWf7A**



එක්සත් ජාතීන්ගේ සංවිධානය සිය 70 වන සංවත්සරය නිමිත්තෙන් 2015 සැප්තැම්බර් මාසයේදී ඇමරිකාවේ නිව්යෝර්ක් හි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ (UNO) ප්‍රධාන කාර්යාලයේ පැවති රැස්වීමේදී තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) 17 ක් යෝජනා කරන ලදී. මෙම ඉලක්ක 17, අරමුණු 169 කින් සමන්විත විය. එසේම මෙම ඉලක්කවල සාර්ථකත්වය ඇගයීම සඳහා ඔවුන් දර්ශක 244 ක් හඳුනාගෙන ඇත. මෙම තිරසාර සංවර්ධන ඉලක්ක ගෝලීය පරිවර්තනයක් උදෙසා වන විශ්ව න්‍යාය පත්‍රයක් සේ සැලකෙන බැවින් එමගින් මුළු ලෝකයම කෙරෙහි දැඩි අවධානයක් යොමු කර ඇත. තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම මඟින් සංවර්ධනයේ ප්‍රධාන සංකල්ප වන මිනිසුන්, ග්‍රහලෝක, සෞභාග්‍යය, සාමය සහ හවුල්කාරිත්වය පදනම් කරගත් සංවර්ධනය සාක්ෂාත් කරන බව ප්‍රකාශ කරයි. මෙම සම්මුතියට සහභාගී වූ රටවල් 193 මෙම ඉලක්ක 17 ඔවුන්ගේම සංවර්ධන න්‍යාය පත්‍ර ලෙස ඇතුළත් කරගෙන තිබේ. තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා ආර්ථික, සමාජීය සහ පාරිසරික දෘෂ්ටි කෝණයන් යන ප්‍රධාන කරුණු තුනක් සලකා බලයි. ශ්‍රී ලංකාව ද මේ සඳහා සහභාගී වූ අතර මෙම සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා කටයුතු කරමින් සිටින රටවල් වලින් එකක්ද වේ. තිරසාර සංවර්ධනයේ දිගු කාලීන ඉලක්ක 17, 2016 ජනවාරි මස සිට වසර 15 ක් තුළදී සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කෙරෙන අතර එම ඉලක්ක 17 පහත පරිදි වේ (United Nations, 2015).



ආචාර්ය එම්. එම්. මෂ්රුෆා
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති
අග්නිදිග විශ්වවිද්‍යාලය,ශ්‍රී ලංකාව

මේ සඳහා සහභාගී වූ සියලුම රටවල් ප්‍රකාශ කළේ දුප්පත්කම, සාගින්න සහ රෝග වලින් තොර ලොවක් අපේක්ෂා කරන අතර සියළුම ජීවීන්ට සමාන ලෙස ජීවත් වීමට අවශ්‍ය බවයි. ඔවුහු බියකින් හා හිංසනයෙන් තොර ලෝකයක් ගැන සිතති. විශ්ව සාක්ෂරතාවය, සමාන සහ විශ්වීය ප්‍රවේශයකින් යුත් අධ්‍යාපනයක්, සෞඛ්‍යාරක්ෂණය, සමාජ ආරක්ෂාව, මානව හිමිකම්, සුරක්ෂිත පානීය ජලය, සනීපාරක්ෂණය සහ වැඩිදියුණු කළ සනීපාරක්ෂාව, ප්‍රමාණවත් සහ පෝෂ්‍යදායී ආහාර සහ සාධාරණ, විශ්වසනීය හා තිරසාර බලශක්ති සඳහා විශ්වීය ප්‍රවේශයක් සහිත ලෝකයක් ඔවුන් බලාපොරොත්තු වෙති. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා රජයන් පමණක් නොව පුස්තකාල ඇතුළු සියළුම පාර්ශවකරුවන් ද සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක වීම ඉතා වැදගත් ය. මෙම ඉලක්ක 17 ම සාක්ෂාත් කර ගැනීම සඳහා "තොරතුරු වෙත ප්‍රවේශය" (IFLA, 2021) ලබා දීම පුස්තකාල විසින් සිදු කළ යුතුය.

**මෙම කාර්යය තුළ මහජන පුස්තකාලයේ ස්ථාවරය කුමක්ද?**

ඉෆ්ලා (2021) විසින් **"**තිරසාර සංවර්ධන ඉලක්ක සන්දර්භය තුළ සම්මත ජාතික හා ප්‍රාදේශීය සංවර්ධන සැලසුම්වලට පුස්තකාල ඇතුළත් කිරීම සහ තොරතුරු ලබා ගැනීම සඳහා සහාය වීම" අරමුණු කර ගත් උපාංග කට්ටලයක් සංවර්ධනය කර එළි දක්වා තිබේ. මෙම ඉෆ්ලා මගපෙන්වීම යටතට ප්‍රධාන අංශ තුනක් ඇතුළත් වේ. එනම් කලාපීය**,** ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් පුස්තකාල සඳහා සහාය වීම**,** ගෝලීය මට්ටමින් සෘජු මැදිහත් වීමක් සහ පුස්තකාලවලට තිරසාර සංවර්ධන ඉලක්ක රාමුවක් ලෙස භාවිතා කිරීමට සහාය වීම සඳහා අවශ්‍ය මෙවලම් හා ද්‍රව්‍ය ලබා දීම යි. ඉෆ්ලා ලෝක පුස්තකාල සිතියම ඔවුන් නිරත වන තිරසාර සංවර්ධන ඉලක්ක ක්‍රියාකාරකම් වල ප්‍රමාණය දෘශ්‍යමාන කිරීමට හොඳ දර්ශකයකි. මෙම සිතියම පුස්තකාල සංචාරය දර්ශකයක් ලෙස භාවිතා කරයි. එක්සත් ජාතීන්ගේ "උසස් මට්ටමේ දේශපාලන සංසදයට" ඉෆ්ලා සහභාගී වේ. ඉෆ්ලා විසින් සිය රටේ සංවර්ධන කටයුතු සඳහා සමාන ලෙස සහභාගී වන ලෙස සියළුම පුස්තකාල දිරිමත් කරනු ලබයි.

පස්තනා (2016) ප්‍රකාශ කළේ "... මහජන පුස්තකාලවලට තිරසාර සංවර්ධනය සඳහා වූ මධ්‍යස්ථානයක් වශයෙන් කිහිප ආකාරයකින් සේවය කළ හැකි ය. එක්සත් රාජධානිය, ඇමරිකා එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව, බ්‍රසීලය, ඊජිප්තුව, අයර්ලන්තය, දකුණු කොරියාව, මියන්මාරය සහ උගන්ඩාව යන රටවල් උපාය මාර්ගික ක්‍රියාකාරකම් සැකසීමේ හා විවිධ අංශ වලින් තිරසාර සංවර්ධන ඉලක්ක ලබා ගැනීමේ අරමුණින් ඒවා සාර්ථකව ක්‍රියාත්මක කිරීමේ ප්‍රවීණයින් ලෙස සැලකේ. පුස්තකාල නිශ්චිත ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය සඳහා අත් පත්‍රිකා සකස් කළ යුතුය. රටවල් කිහිපයක මහජන පුස්තකාල මහජන/සිවිල් සමාජය එවැනි සේවාවන් සිදු කරන අතර, අපි ඒවා පසෙක තබා සාම්ප්‍රදායික සේවාවන් මත පමණක් රැඳී සිටින්නේ ඇයි? තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේදී මහජන පුස්තකාලයාධිපතිවරුන් තීරණාත්මක කොටස්කරුවන් වන බැවින් ඔවුන් තම සේවාවන් ප්‍රජා සත්කාරක සේවාවන් දක්වා ව්‍යාප්ත කර ගැනීම සඳහා උපායමාර්ගික ක්‍රියාකාරකම් සකස් කිරීම ඉතා වැදගත් ය. මහජන පුස්තකාල වලට සම්බන්ධ විය හැකි එවැනි ක්‍රියාකාරකම් කිහිපයක් පහත වගුගත කර ඇත.

| ඉලක්ක | විස්තර |
|---|---|
| ඉලක්කය 1: දුගී භාවය නැත | • රැකියා තොරතුරු සේවා:, ජීව දත්ත ලේඛන පත්‍රිකාව සැකසීම, රැකියා සඳහා ඉල්ලුම් කිරීම ආදිය සඳහා වැඩසටහන් පැවැත්වීම සහ උපදේශනය<br>• ව්‍යවසායකත්ව, ආර්ථික සංවර්ධනය සඳහා තොරතුරු සේවාවන් සැපයීම<br>• රැකියා අවස්ථා සහ වාණිජ කටයුතු උත්පාදනය හා සැපයීම |
| ඉලක්කය 2: බඩගිනි නැත | • කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, ගොවිතැන සහ කෘෂිකර්මාන්තය දියුණු කිරීම සඳහා මූල්‍ය තොරතුරු සේවා සැපයීමෙන් සිවිල් සමාජයට සහයෝගය දැක්වීම<br>• අනුබද්ධ සේවා, ණය පහසුකම් ආදිය හඳුනා ගැනීමට ඔවුන්ව දැනුවත්කිරීම |
| ඉලක්කය 3: යහපත් සෞඛ්‍ය | • සෞඛ්‍ය තොරතුරු සේවා සැපයීම<br>• කාලීන මාතෘකා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්. උදාහරණ වශයෙන්; කොරෝනා, ඩෙංගු, පිළිකා |
| ඉලක්කය 4: ගුණාත්මක හා සාමාන අධ්‍යාපනය | • වැඩසටහන ඉගෙනුම් අවකාශ<br>• භෞතික හා අතථ්‍ය සම්පත් සඳහා ප්‍රවේශය (ඊ-සම්පත් සඳහා සම්මුතිය)<br>• ඩිජිටල්කරණය කළ සේවාවන්<br>• සාක්ෂරතා අධ්‍යාපනය සහ පළපුරුදු ඉගෙනුම් අවස්ථා.. |
| ඉලක්කය 5: ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය | • කාන්තාව සවිබල ගැන්වීමේ වැඩසටහන්<br>• ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, කාන්තාවන් හා ගැහැණු දරුවන්ට එරෙහි හිංසනය, කාන්තා අයිතිවාසිකම්, උපදේශනය, සෞඛ්‍ය සාක්ෂරතාව යනාදිය පිළිබඳ සම්මන්ත්‍රණ සහ වැඩමුළු<br>• ස්ත්‍රී පුරුෂ භාවය සම්බන්ධ වැඩසටහන් සඳහා අවකාශය |
| ඉලක්කය 8: යහපත් රැකියා හා ආර්ථික වර්ධනය | • මෙය ඉලක්ක 1 සමඟ අන්තර් රඳා පවතී: මේ අනුව ඉලක්ක 1 ට සහය දැක්වීමේ ක්‍රියාකාරකම් ඉලක්ක 8 සඳහා ද අදාළ වේ. |
| ඉලක්කය 9: නවීකරණය සහ යටිතල පහසුකම් | • අන්තර්ජාල ප්‍රවේශ පහසුකම්; ඩිජිටල් බෙදීම් පාලනයට ප්‍රවේශ මධ්‍යස්ථාන<br>• ක්‍රියාකාරී සාක්ෂරතාව සඳහා තාක්ෂණ හුවමාරුව<br>• සාමාජිකයින්ගේ නිර්මාණශීලීත්වය, නවෝත්පාදක කුසලතා සංවර්ධනය කිරීම, සඳහා නිපැයුම් අවකාශ ලබා දීම සහ තාක්ෂණය දියුණු කිරීම |
| ඉලක්ක 10: අඩු කරන ලද අසමානතා | • ගතිලක්ෂණ සහ ජනවාර්ගික සංකල්ප යනාදියෙන් බැහැරව සියලු සාමාජිකයින්ට එකසේ සැලකීම<br>• පුරුෂයින්ට සහ ස්ත්‍රීන්ට, පිරිමි දරුවන්ට සහ ගැහැණු දරුවන්ට සමානව සැලකීම, මෙය තිරසාර සංවර්ධන ඉලක්ක 5 සමඟද අදාළ වේ. . |
| ඉලක්කය 11: තිරසාර නගර සහ ප්‍රජාවන් | • ප්‍රජාව සමඟ සම්බන්ධ වීම /බැඳීම සහ පුරවැසිභාවය පිළිබඳ හැඟීම වර්ධනය කිරීම<br>• පුරවැසි හැඟීම , සමාජ-සිවිල් සමගිය යනාදිය වැඩි දියුණු කිරීම සඳහා ප්‍රජාතාන්ත්‍රික පොදු අවකාශ ඇති කිරීම<br>• වගකීම් පිළිබඳව දැනුවත් කිරීම සඳහා වැඩසටහන් පැවැත්වීම. |
| ඉලක්කය 15: ජීවිතය සහ භූමිය | • හරිත පුස්තකාල සංකල්පය පිහිටුවීම සහ අභිප්‍රේරණය කිරීම |
| අරමුණ 16: සාමය, යුක්තිය සහ ශක්තිමත් ආයතන | • මෙම ඉලක්කය තිරසාර සංවර්ධන ඉලක්ක 11 සමඟ සමාන වේ<br>• පුස්තකාල / දැනුම් කේන්ද්‍රස්ථාන හරහා සම්පත් හුවමාරුව<br>• රජයේ විවෘත තිබේ නම් ඒවාට සහයෝගය දැක්වීම. |
| ඉලක්කය 17: ඉලක්කය සපුරා ගැනීම සඳහා හවුල්කාරිත්වය | • වැඩසටහන් සැපයීම සහ සංවිධානය කිරීම සඳහා පළාත් පාලන ආයතන, (, මහ නගර සභා, නගර සභා ප්‍රදේශීය සභා) විශ්ව විද්‍යාල, කර්මාන්ත, ව්‍යවසායන් සහ ජාතික පුස්තකාල සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම |

ඉලක්ක 6, 7, 12, 13 සහ 14 මහජන පුස්තකාල ක්‍රියාකාරකම් සමඟ සෘජුවම සම්බන්ධ නොවේ. කෙසේ වෙතත්, තොරතුරු සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම යන කාර්යය යටතේ මෙම අරමුණු වලට සහාය වීමට ද හැකියාව පවතී. මහනගර යටතේ පවතින හෝ දිස්ත්‍රික්කයක ප්‍රමුඛ පෙළේ මහජන පුස්තකාල වලට සෙසු සියළුම පුස්තකාල හා ප්‍රජා මධ්‍යස්ථාන හවුල් කර ගනිමින් එවැනි පුස්තකාල කේන්ද්‍ර හෝ දැනුම් කේන්ද්‍ර වල ජාලයක් නිර්මාණය කළ හැකි වේ. මෙම කේන්ද්‍රය තුළින් ඉලෙක්ට්‍රොනික සම්පත් සඳහා ප්‍රවේශ වීම, විවිධ එකතුන් වලට ප්‍රවේශ වීම, හිතකර ඉගෙනුම් පරිසරයක් සැපයීම, මූලික සාක්ෂරතා ක්‍රියාකාරකම්, පුහුණුව සහ තාක්‍ෂණය හුවමාරුව වැනි කාර්යන් සම්බන්ධීකරණය කළ හැකිය. මෙබඳු ආකාරයේ දැනුම් කේන්ද්‍ර පාසල් පුස්තකාල, විද්‍යාල පුස්තකාල, මහජන පුස්තකාල, විශ්ව විද්‍යාල පුස්තකාල, ජාතික පුස්තකාල සහ පුස්තකාල, දේවස්ථාන, පන්සල් සහ පල්ලි වැනි සිවිල් ආයතන සමඟ සහයෝගයෙන් වැඩි දියුණු කෙරේ. මෙම ලිපිය මගින් ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සහ ශ්‍රී ලංකා පුස්තකාල සංගමය වැනි ප්‍රමුඛ පෙළේ ආයතන හා වෘත්තීය සංවිධාන විසින් තම උපාය මාර්ගික සැලසුම් සකස් කිරීමේ දී තිරසාර සංවර්ධනය මූලික සංකල්පයක් ලෙස ඇතුළත් කිරීමත් මහජන පුස්තකාල හරහා සාර්ථක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා මග පෙන්වීම, උපකාර ලබා දීම සහ මූල්‍ය සහාය ලබා ගැනීම කෙරෙහි සිය උපාය මාර්ගික සැලසුම් පුළුල් කිරීමත් නිර්දේශ කෙරේ.




## References


Corradini, F. (2020), Sustainable Development Goals in libraries of the German-speaking countries, *Journal of EAHIL* 2020; Vol. 16 (4): 11-14 doi: 10.32384/jeahil16439

IFLA (2021), IFLA Toolkit: Libraries, Development and the United Nations 2030 Agenda (Revised version - March 2021), Available at https://www.ifla.org/publications/node/10156


Pastana, Q.J.V.(2016), Libraries as a Sustainable Development Tool: an Integrated Framework and Strategy, *Oxford project*, Southeast Asia Conference, Available at https://www.academia.edu/24913314/Libraries_as_a_Sustainable_Development_Tool_an_Integrated_Framework_and_Strategy

United Nations (UN) (2015), "Transforming our world: the 2030 agend a for sustainable development", https://sustainabledevelopment.un.org/content/documents/21252030%20Agenda%20for%20Sustainable%20Development%20web.pdf (accessed 12 December, 2020).


## ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ විශේෂ මහා සභා රැස්වීම




ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීම මාර්ගගත ආකාරයෙන් පැවැත්වීම සඳහා සාමාජිකත්වයේ කැමැත්ත ලබා ගැනීම පිණිස 2021 සැප්තැම්බර් 24 දින අතිරේක මහා සභා රැස්වීමක් පැවැත්විණි. සංගමයේ සභාපති විසින් මෙම මාර්ගගත රැස්වීමේදී සාමාජිකයින් 100 කට අධික සංඛ්‍යාවක් අමතමින් නාම යෝජනා කැඳවීම සහ මහා සභා රැස්වීමේදී ආරක්ෂිතව සහ රහස්‍ය ආකාරයෙන් ඡන්දය ප්‍රකාශ කිරීම අවශ්‍යතාව කෙසේද යන්න දැනුවත් කරන ලදී. මෙම තීරණය සාමාජිකත්වය ඒකමතිකව අනුමත කළේය. කෙසේ වෙතත්, රටේ තත්ත්වය සාමාන්‍ය අතට හැරෙන තුරු පවත්නා කවුන්සිලය තවත් වසරක් සඳහා පැවතිය හැකිදැයි ඔවුන් විමසා සිටියහ. කෙසේ වෙතත්, වර්තමාන කවුන්සිලයේ සාමාජිකයින් මහා සභා රැස්වීම පැවැත්වීම සඳහා තම සහයෝගය ලබා දෙන බවට ප්‍රකාශ කර ඇති බවත් ඇතැම් සාමාජිකයින්ට එම තනතුරු තවත් වසරක් සඳහා පවත්වාගෙන යාමට පෞද්ගලික දුෂ්කරතා ඇති බවත් සභාපතිවරයා නැවත අවධාරණය කළේය. මෙය කෙටි නමුත් සතුටුදායක හමුවක් වූ අතර මිනිත්තු කිහිපයක් කාලයක් තුළ සාමාජිකයින්ට එකිනෙකා සමඟ කතා කිරීමටත් ඔවුන්ගේ මිත්‍රත්වය අලුත් කර ගනිමින් දුෂ්කර තත්වයන් යටතේ වුවද යහපත් හැඟීම් එකතු කර ගැනීමටත් අවස්ථාව ලැබුණි.







## SLLA ප්‍රකාශන කමිටුව (Publication Committee) 2020/2021

### ප්‍රධාන කමිටුව

| | |
|---|---|
| ටී. ශ්‍රීධරන් මිය | චන්දිමා වාදසිංහ මිය |
| (ප්‍රකාශන නිලධාරි) | බී.එන්.ජී.ඒ සුනිල් |
| කෝමදී මුරුගදාස් මිය | ප්‍රේමරත්න මහතා |
| එම්.එස්.එම්. ෂිහාම් මහතා | ඒ.වී.එම්.කේ. අංකුඹුර මිය |
| පවිත්‍රා විජයවර්ධන මිය | |

### අනු කමිටුව (පුවත් හසුන)

| | |
|---|---|
| ටී. ශ්‍රීධරන් මිය | ගයනි ලසන්තා පෙරේරා මිය |
| කෝමදී මුරුගදාස් මිය | |

### අනු කමිටුව (සඟරා)

| | |
|---|---|
| ටී. ශ්‍රීධරන් මිය | බී.එන්.ජී.ඒ සුනිල් |
| | ප්‍රේමරත්න මහතා |
| චන්දිමා වාදසිංහ මිය | එස්. නවනීතක්‍රිෂ්ණන් මයා |